**මිහින්තලය ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අභිතකර මතය**

මිහින්තලය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ). 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 ප්‍රකාරව පිළියෙල කළ බවට වූ ප්‍රකාශය, අඛණ්ඩ පැවැත්ම, සංගතභාවය, මැනීමේ පදනම, ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සටහන් අංක 2 සහ 3 පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිහින්තලේ නගරයේ මුහුදු මාළු ලැල්ල සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.21,860 ක් ලැබිය යුතු දෑ යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. | ලැබිය යුතු දෑ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | කෘෂි අලෙවි මධ්‍යස්ථානයේ පිහිටි කඩ කාමරය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ කඩ කුලී රු.198,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂයේ ගෙවා අවසන් වන දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ලබාගෙන ඇති ණය මුදලේ රු.293,140 ක් දිගුකාලීන වගකීම් ලෙස දක්වා තිබුණි. | 2012 වර්ෂයේ සිට පැවත එන ණය මුදලක් බැවින් දිගු කාලීන ණය ගැනීම් යටතේ පෙන්නුම් කර ඇති බව. | ජංගම වගකීම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී රු.660,000 ක පරිගණක උපාංග මිලදී ගැනීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණ මිලදී ගැනීම් ලෙස දක්වා නොතිබුණි. | පිළිගන්නා බව. | මුදලින් කරන වත්කම් මිලදී ගැනීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව සතුව රු.5,000,000 ක ස්ථාවර තැන්පත් තිබුණු නමුත් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ එය රු.4,500,000 ක් ලෙස රු.500,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සභාවේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ලැබුණු පොලී රු.606,335 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | -එම- | පොලි ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (උ) | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද පොලිය රු.53,478 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගෙවූ පොලී ලෙස අඩුකර දැක්විය යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය එකතු කර දක්වා තිබුණි. | -එම- | පොලි ගෙවීම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ඌ) | LDSP ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් කාර්යාල ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය පැනල සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.113,780 ක් දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා නොතිබුණි. | පුවත්පත් දැන්වීම සහ CEB සඳහා ගෙවූ බැවින් දේපල පිරියත සහ උපකරණ යටතේ නොදැක්වූ බව. | දේපල පිරියත වෙනුවෙන් දරා ඇති බැවින් ඒ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත රු.1,133,826 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබුණු නමුත් එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් ලෙස දක්වා නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සභාවට විරුද්ධව වෙනත් පාර්ශව විසින් නඩු 02 ක් පවරා තිබු නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. | පිළිගන්නා බව. | විස්තර සටහන් තුළින් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | දේපළ පිරියත සහ උපකරණවලට අයත් රු.150,203,292 ක්වූ ඉඩම් වල වටිනාකම වත්කම් සහ වගකීම් ප්‍රකාශයට අයත් සටහන් 16 හි දක්වා නොතිබුණි. | ඉඩම් වටිනාකම් ඉඩම් ශීර්ෂය යටතේ නොපෙන්වන නමුත් මුළු වටිනාකම් ශේෂය තුළ ඇතුළත් බව. | සටහන්වල විස්තර නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු දෑ වලට අයත් ලැබිය යුතු කඩ කුලී උපලේඛන අනුව රු.285,150 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශය අනුව එය රු.388,642 ක් වීම නිසා රු.103,492 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් වියදම්වල එකතුව රු.42,443,130 ක් වුවත් එයට අදාළ සටහන් 08 අනුව එය රු.36,587,995 ක් වීම නිසා රු.5,855,135 ක වෙනසක් විය. | ක්ෂයවීම් වෙනම පෙන්වීම නිසා මෙම වෙනස සිදුවී ඇති බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුවේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශේෂ පිරික්සුමේ සඳහන් ගිණුම් 50 ක් වෙනුවෙන් ලෙජර් ගිණුම් පවත්වාගෙන නොතිබුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | දිගු කාලයක සිට පැවත එන අතර කාල විශ්ලේෂණ නොමැති බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | වටිනාකම රු.1,019,728 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය සඳහා ගැලපීම් ලෙස රු.2,700,565 ක් සඳහන් කර තිබුණු නමුත් එය තහවුරු කෙරෙන විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 210 (2) | සමාලෝචිත වර්ෂයේදී ආදායම් බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ගෙවූ රු.21,630 ක ප්‍රමාද ගාස්තු අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.3,760,906 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.8,740,711 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,045,050 | 1,296,700 | 1,296,700 | 101,844 | 1,124,050 | 1,173,700 | 1,173,700 | 101,844 |
| (ii) | කුලී | 8,419,674 | 8,336,571 | 11,007,626 | 2,106,649 | 7,783,529 | 6,161,529 | 7,075,856 | 4,777,704 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 105,000 | 143,840 | 85,340 | 58,500 | 610,150 | 1,324,820 | 1,324,820 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,084,250 | 7,170,583 | 6,908,338 | 5,992,569 | 3,967,250 | 7,623,244 | 7,623,214 | 5,730,324 |
| | | 13,653,974 | 16,947,694 | 19,298,004 | 8,259,562 | 13,484,979 | 16,283,293 | 17,197,590 | 10,609,872 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(II) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අවශ්‍ය කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ii) | 2019 වර්ෂයේ සිට පැවත එන රු.101,844 ක් වූ හිඟ කසළ බදු අයකර ගැනීම සමාලෝචිත වර්ෂයේදීද කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගත යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබෙන හිඟ කුලී ආදායම රු.2,106,649 ක් විය. | මෙම හිඟ මුදලින් රු.671,260 ක් හැර ඉතිරි මුදල් අයවී ඇති බව. | -එම- |
| (ii) | 2019 සිට පැවත එන හිඟ ටෙන්ඩර් කුලිය රු.768,592 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු වෙනුවෙන් 2022 දෙසැම්බර් 25 දිනට රු.954,645 ක් අයකර ගෙන නොතිබුණි. | රු.378,070 ක් අයකර ගෙන ඇති බව. | -එම- |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,463,823 ක් හා මුද්දර ගාස්තු රු.2,574,101 ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල ලබාගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව. | මෙම මුදල් ලබා ගැනීම සඳහා අදාල ආයතන වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය. |

### 3. මෙහෙයුම් සමාලෝචනය
**පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2021 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබුණු කසළ කැබලි කිරීමේ යන්ත්‍රය 2022 වර්ෂයේදී භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | කසළ අංගනය ඉදිකිරීමෙන් පසු මෙම කසළ කැබලි කිරීමේ යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | ප්‍රයෝජනයට ගැනීම කඩිනම් කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93(ඇ) වගන්තිය ප්‍රකාරව වීථිවල තිබෙන සියළුම කසළ නිවාසවල තිබෙන කසළ සහ බැහැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම ප්‍රාදේශීය සභාවේ කාර්යයක් විය යුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | කසළ විධිමත් ලෙස බැහැර කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සභාවේ වගකීමක්ය. |